ජයතිලක
කම්මැල්ලවීර
මෙල්බර්න්හිදී



ඉතා තරුණ වියේ පළකළ 'බියනොවන් අයියන්ඩි' නමැති තම ප්‍රථම කාව්‍ය සංග්‍රහයෙන් ම ප්‍රවීණ කවියකු වෙත තිබිය යුතු සියලු සුදුසුකම් විදහා පෑ රත්න ශ්‍රී විජේසිංහයන් මානවවාදී දෘෂ්ටියෙන් ද සමාජ නිරීක්ෂණයෙන් ද භාෂා ප්‍රවීණත්වයෙන්ද පිරිපුන් කලාකරුවකු බව ශ්‍රී ලාංකික රසික විචාරක පර්ශද තුළ අවිවාදයෙන් පිළිගැනේ. ඔහු අද ශ්‍රී ලංකාවේ සිටින ප්‍රවීණතම කවීන් දෙතුන්දෙනාගෙන් කෙනෙකි. ප්‍රබුද්ධ ගීත රචකයන් අතර ඔහු සිටින්නේ අනෙක් සියල්ලන්ට වඩා බොහෝ ඉදිරියෙනි. සාහිත්‍ය විෂය සම්බන්ධ දේශකයන් අතර ද ඔහු සිටින්නේ දෙතුන් දෙනෙකුට පමණක් හිමි ඉදිරි පෙළේ ම ය.

මේ ප්‍රකාශවලින් මුල් දෙක සාක්ෂි සහිතව ඔප්පු කිරීමේ වගකීමට මම බැඳී සිටිමි. තෙවැන්න ඔබට පවරමි. ඒ ඇයි දැයි පසුව කියන්නෙමි.

පෙබරවාරියක් සේ කොළ හැලී
ජීවිතේ ඉපල් වූ බව සැබෑයි
උදේ හිට බිතක්කන වාඩි වී
උඹ අඬන්නේ ඇයිද මිණිබිරී?
රබර් යායට උඩින් - බලාගත් අත බලන්
හූල්ලන්නේ කිමද මිණිබිරී?

වළලු ඕනෑ වී ද නුඹෙ අතට?
මාල ඕනෑ වී ද නුඹෙ කරට?
නැත දුවේ,
නුඹ වළලු නො ඉල්ලන බව දනිමි,
සත් වසරකට පෙරදි නුඹෙ පියා,
බන්ධනාගාරයට ගෙන ගියා-
දෑතට ම යකඩ වළලු දමා
එද සිට කිසිම ද
නුඹ වළලු ඉල්ලලා නොහැඬුවා

එසේනම්,
නුඹ හඬන්නේ ඇයිද කලකිරී?
කියාපන්
කලක සිට නුඹ ඉල්ලලා හඬන රැකියාව මතක් වී
නුඹ හඬනවා නේද මිණිබිරී?

දුවේ ඒ වෙළෙන්දෝ අදත් මෙහි ආවෝද?
නුඹට ඒ රස්සාව අරගන්ට කීවෝද?
උං තුමූ එද මෙන් සේරිවාණිජ - කච්චපුටයෝ ය
වැඩිමිලට රස්සාවල් විකුණමින්
ඇවිදුනා වෙළෙඳෝය

දුවේ අපි දිළිඳු වෙමු
අපේ අත මුදල් නැත
ජ්‍යෙෂ්ඨය දැලි බැඳුණු මැටි වළඳකට වඩා නොඅගී
ය.
මේ ගෙදර
මා සන්තකව ඇති එක ම අගනා ම දෙය නුඹ ය

නුඹ විකුට....? උගස් කොට....?
අහෝ එය කිසිදක නොවේවා!

දුම් බැඳී කළු ගැහුණු
උඹේ ඔය රත්තරන් ජීවිතය
ඉරි අඳින්නට උන්ට නොදෙනවා
සත්තකයි නොදෙනවා
මගේ පණ තියෙනකම්
කොහොම හරි උඹ රස්ස කරනවා

දුප්පත් මහළු ස්ත්‍රියක තම මිණිබිරිය සමාජ ව්‍යසනයෙන් බේරාගෙන රක්ෂා කිරීමේ අදිටන ප්‍රකාශ කරන්නක් ලෙස ගොතා ඇති මේ කවිය රත්න ශ්‍රී ගැන මගේ ඉහත පළමු ප්‍රකාශය තහවුරු කෙරෙන හොඳම සාක්ෂියක් නොවන්නේ ද? කුණු වී සැරව ගලන අප සමාජ දේහය වෙත ඔහුගේ නිරීක්ෂණාක්ෂිය යොමුවන හැටි බලන්න. වත්මන් සිද්ධිදමය කවියා ඉදිරිපත් කරන්නේ සේරිවාණිජ ජාතක රූපකය ඔස්සේය. එද මහළු මිත්තණිය සහ ඇගේ මිණිබිරිය රවටා රන්තලිය ගන්නට තැත්කළෝ කූඨ වෙළෙඳුන් ය. අද දුප්පත් තරුණ මිණිබිරිය රැකියා පොරොන්දුවෙන් රවටා ඇගේ වටිනාම වස්තුව වන කන්‍යාභාවය සොරාගෙන ඇය ගණිකා වෘත්තියට ඇද දමන්නට එන්නෝ බලවත්තු ය. ඔවුහු එක්කෝ දේශපාලකයෝ වෙති. නැතහොත් ධනපති ව්‍යාපාරිකයෝ වෙති.

ජාතක කතාවේදී දූවිලි බැඳුනු තලිය රන්තලියක් බව වෙළෙන්ද දැනගන්නේ ඉරි ඇඳ බැලීමෙනි.

'දුම්බැඳී කළු ගැහුණු උඹේ ඔය රත්තරන් ජීවිතය ඉරි අඳින්නට උන්ට නොදෙනවා. සත්තකයි නොදෙනවා'

මෙද කූඨ වෙළෙන්දන් එන්නේ කෙල්ලගේ ජීවිතයේ ඉරි අඳින්නට ය. 'දුවේ ඒ වෙළෙන්දෝ අදත් මෙහි ආවෝ ද? නුඹට ඒ රස්සාව අරගන්ට කීවෝ ද?' නුඹට ඒ රස්සාව දෙනවාය කීවෝද? යනුවෙන් නොකියා අරගන්ට කීවෝ ද? යනුවෙන් ලිවීම මගින් එය ඉහත පදවලින් කියැවෙන දැරිය අපේක්ෂිත රැකියාව දීමේ පොරොන්දුවක් නොවන බව අඟවයි. රස්සාව අරගන්ට කීවෝ ද? යයි කියන විට ගණිකා වෘත්තිය තෝරා ගන්නැයි කී බව ඇඟෙනවා නේද? 'නුඹ විකුට....? උගස්කොට....? අහෝ එය කිසිදක නොවේවා!' යයි දෙවනුව කියැවෙන වදන්වලින් ඉහත අදහස වඩාත් තහවුරු වෙයි. සංකේත භාවිතයේදී කවියා තම දෑස මානයේ ඇති දේම උපයෝගී කර ගන්නා හැටි බලන්න. 'රබර් යායට උඩින් - බලාගත් අත බලන් හූල්ලන්නේ කිමද මිණිබිරී' යයි කියන විට රබර් වත්තක් ළඟ ඇති නිවසක් බව අපට පෙනෙයි. ඒ පරිසරයෙන්ම දිළිඳුකමත් අපේක්ෂාභංගත්වයත් සංකේතවත් කරන්නේ 'පෙබරවාරියක් සේ කොළ හැලී ජීවිතේ ඉපල් වූ බව සැබැයි' යනුවෙනි. ඕස්ට්‍රේලියාවේ නම් සෘතු මාරුවත් සමඟ කොළ හැලෙන ගස් කොතෙකුත් ඇතත් ලංකාවේ කොළ හැලෙන්නේ රබර් ගස්වල පමණි. ඒ ද පෙබරවාරියේ ය. එ සේ ම රබර් යාය අඳුරු පාළු බවක් ද ජනිත කරවයි. මේ සියල්ල විසින් මවනු ලබන්නේ දිළිඳු අසරණ ජීවිත ගැන කතාකරන්නට බෙහෙවින්ම උචිත පරිසරයකි.

තම ප්‍රථම කාව්‍ය සංග්‍රහයෙන්ම මෙවැනි පිරිපුන්, මෙවැනි සංවේදී රචනා රැසක් ඉදිරිපත් කළ රත්න ශ්‍රී එතෙක් මෙතෙක් ලියූ කවි සහ ගේයපද මගින් මා ඉහත කී උස් තැනට නැග ඇති බවට තවත් සාක්ෂි අවැසි වන්නේද?

එහෙත් මම තවත් නිදසුනක් දෙකක් ගන්නට කැමැත්තෙමි.

රත්න ශ්‍රී විජේසිංහයන් 'වස්සානේ' කාව්‍ය සංග්‍රහය පළකරන්නේ 1985 වර්ෂයේ දී ය. එම කෘතිය ඔහු පිළිගන්වන්නේ තම ආදරණීය බිරිය වෙතය. ඒ පිළිගැන්වීම ද කවියෙනි. එය සාම්ප්‍රදායික පිදුමකට වඩා අද්‍යතන සමාජ ආර්ථික තතු ගෙන හැර පාන තියුණු කවියක් වෙයි එහි ඇරඹුම මෙ සේ ය.

කිරි ශිරා සියක් ඉල්පී
කෘශ ළැමට ඇදී එත්මැයි
පියවුරෝ දෙදෙන හොරැහින්
බිම බලාගෙන හඬත්මැයි
ලේ කඳුළු බින්දු නොසිඳී
ළැම දුකින් තෙත් කරත් මැයි
හාමතේ නොලා දෙදරුන්
රක්ෂා කෙරෙත්මැයි

නුඹ වින්ද දුකින් උපනෙන්
මේ කවි මගේද නොදනිමි

බුදු වෙන්ට ඕන නුඹලා
මට නිවන් මග කියල්ලා

මීට ම තව පද එක්කොට ඔහු නිමැවූ තරමක් දිගු කාව්‍ය නිර්මාණයෙන් කොටසකි ගුණදාස කපුගේ විසින් ගැයෙන 'මගෙ බිසවුනේ අසාපන් - නුඹ මන්ත්‍රීදේවි නූනි' යන අගනා ගීය බවට හැරෙන්නේ. මෙ සේ වටිනා නිර්මාණ බවට පත්වන්නේ කවියාගේ හදවතේ උපදින ගේහසිත ප්‍රේමයේ මහිමය සහ මානවවාදී සමාජ දැක්මේ ශක්තිය නොවන්නේද?

රත්න ශ්‍රී ගේ ගීතය ගැයුම පමණක් අරමුණු ගරගත් හුදු ගේය පදයක් නොවන්නේ ම ය. එය අර්ථ පූර්ණ ගැඹුරු හා සංවේදී කවියේ ම තවත් රූපයකි.

තරුණ වියට එළඹෙන දියණිය අමතා පියෙකු දෙන උපදෙසක් සේ ලියැවුණු 'සුවඳ මුවරද බරිනි ආකුල යෞවනය දෙරකඩ හිඳී' යන ගීතය ම පමණක් වුව ද මේ සඳහා නිදසුන් ලෙස සෑහේ.

'දරුවනේ වන මලක් යනු එක රැයක අසිරිය නම් නොවෙයි - ගහත් පොළොවත් වින්ද දුක් ගිනි මලක රුව ගුණ බිහිකරයි- රොන් සලා පෙති විද හිනැහෙන කුසුම සතු යුතුකම මෙයයි, උපන් බිම මහපොළොව දූවිලි නිබඳ සිහිපත් කළ යුතුයි' යන උපදෙස පියෙකු එක් දරුවකුට දෙන උපදෙසක් නොව තරුණ වියේ සුන්දරත්වය අත්විඳින අතර ම තමා කවුද, තමාගේ වගකීම් කවරේද යන්න අමතක නොකරන්නැයි සමස්ත ජාතියේ ම දරුවන්ට දෙන්නාවූ ළෙන්ගතු උපදෙසක් නොවන්නේද?

'ගුරු තරුව සෙමින් බැසයයි - ගැලු එළිය නොයා නවතියි
පිතු සෙනේහයෙන් මග කියා දුන්නු - ගුරු පාද පියුම් සුවඳයි'

මේ පදවලින් ඇරඹෙන රත්න ශ්‍රීගේ ගීතය එක් නිශ්චිත ගුරු උතුමෙකු අරබයා ලියන ලද්දේ වුව ද එයින් සමාජය යහපත් මගකට යොමු කිරීමේ වගකීම දරණ ගුරුවරයා කෙබඳු කෙනෙක් විය යුතුද යන්න සමස්ත ගුරු පරපුරටම කියා දෙන්නේ යයි මම සිතමි.

මෙවන් වටිනා ගීත සහ වටිනා කවි එකක් දෙකක් නොව සිය ගණනක් රත්නේගේ නිර්මාණ අතරින් ගෙන ඔබට පාන්නට මට හැකි නමුත් පත්තර පිටුවක ඉඩකඩ තුළ එය කිසිසේත් නො කළ හැක්කකි. එසේ වුවද මා තෝරා ගත් නිර්මාණ දෙක තුන ලබන දෙසැම්බරයේ මෙල්බර්න් නගරයේදී ඔබට මුණ ගැසෙන ඒ අග්‍රගණ්‍ය කලාකරුවා කවරෙක්දැයි හඳුනා ගන්නට ප්‍රමාන වේයයි සිතමි.

දැන් මම මේ සටහන ආරම්භයේ දී කළ ප්‍රකාශ දෙකක් සනාථ කර ඇතැයි සිතන්නෙමි. තෙවැන්න එනම් රත්න ශ්‍රී යනු සාහිත්‍ය විෂය සම්බන්ධ දේශකයන් අතර ද මුල් පෙළේ හිඳින්නකු බව ඔප්පු කිරීමේ වගකීම රත්න ශ්‍රී ටත් එය අත්දැකීමෙන් පසක් කර ගැනීමේ වගකීම ඔබටත් පවරා නවතිමි. ඒ සඳහා දෙසැම්බරයේත් ලබන ජනවාරියේත් මෙල්බන් වාසී කලා රසිකයන්ට අවස්ථාව ලැබෙනු ඇති.

# එන්න අපි ඔහු ඇසුරු කරමු



MASTER TUTORING ACADEMY
MTA
"Your success is our satisfaction"

## Master Tutoring Academy

**New Centre will be started at**

**36, Kincumber Drive, Glenwaverley**

- Biology Year 11 & 12
- Science Year 9 & 10

- YEAR 3 & 4 English/Maths
- YEAR 5 to10 English/Maths

- Scholarship classes (Mel.High, Macrob, John Monash)

- Small group classes ( Max 10 students per class)

**Coordinated By – Nihal Kodikara (B.Sc.,M.Phil.,MBA)**

**Tel:** 0425 403 105

**Email:** admin@mastertutoring.com.au

**Web :** www.mastertutoring.com.au